**ඒ.එච්.ටී. තරිඳු විදුමිණි**
පරිසර කළමනාකරණ නිලධාරී
පරිසර අමාත්‍යාංශය

# ශාක හා සත්ව විශේෂවල සංරක්ෂණය සඳහා බිහි වූ රතු දත්ත ලැයිස්තුව

අනාදිමත් කාලයක සිට මිනිසා පරිසරය හා සහජීවනයෙන් බැඳී කටයුතු කරයි. පරිසරයේ ඇති ගහකොළ සතුන් ඔවුන්ගේ ජීවිතයේ එක් කොටසක් ලෙස සලකා ජීවත් වූ මිනිසා ක්‍රමයෙන් තම අවශ්‍යතාවන් පහසුවෙන් සපුරා ගැනීම සඳහා පරිසරය තමන්ට රිසි පරිදි නතුකර ගැනීමත් සමග ජීවන රටාවද වෙනස් විය. මෙම වෙනස් වීම සමග පරිසරය හා සහජීවනයෙන් කටයුතු කළ මිනිසා පරිසර අසමතුලිතතාව වර්ධනය වන පරිදි කටයුතු කිරීම නිසාවෙන් පරිසර පද්ධතීන්වල පිරිහීම හමුවේ පරිසර හානිය දැක ගත හැකි විය. එහි අයහපත් ප්‍රතිඵල ලෙස වනාන්තර, වාතය, ජලය සහ පාංශු ඇතුළු ස්වාභාවික සම්පත් ක්ෂය වීමේ ආරම්භය සිදු විය.

මෙසේ පරිසර පද්ධතිවල ක්‍රමික පිරිහීමෙන් වර්ධනය වූ පරිසර අසමතුළිතතාවය හේතුවෙන් ශාක හා සත්වයන්ට මුහුණ දෙන්නට සිදු වූ නව ජීවන රටාවන් හමුවේ අනුගත වීමට නොහැකි වීමෙන් ආහාර හා ජලය වාසස්ථාන සොයා ගැනීමට දුෂ්කර වූ අතර විලෝපිකයන්ට පහසුවෙන් ගොදුරු වීම හා ස්වාභාවික ආපදාවන් වැනි කාරණා හමුවේ මිහිතලය තුළින් යම් ජීවී විශේෂයකගේ ගහනය අඩුවීමෙන් වඳවීයාමේ තර්ජනයට හා වඳවී යාම නැමැති ඛේදනීය තත්වයන්ට මුහුණ පාන ලදී.

මෙම තත්වය හමුවේ සොබාදහමේ අඛණ්ඩතාව සහ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ස්වාභාවික සම්පත් සාධාරණ ලෙස භාවිතා කිරීම දිරිගැන්වීමට සහාය දීමත්, ස්වාභාවික සම්පත් භාවිතා කිරීම පාරිසරික වශයෙන් තිරසාර බව සහතික කිරීම පෙරදැරි කර ගෙන 1948 වර්ෂෙයදී ඔක්තෝබර් 5 වන දින ස්වාභාවික සම්පත් සංරක්ෂණය සඳහා ජාත්‍යන්තර සංගමය (IUCN) ප්‍රංශයේ ෆොන්ටයින්බ්ලූ හිදී ආරම්භය සිදු විය.

මෙම සංවිධානයේ මූලිකත්වයෙන් ලෝකයේ විවිධ පාරිසරික හා මානව ක්‍රියාකාරකම් හේතු කොටගෙන වඳ වී යාමේ තර්ජනයන්ට මුහුණ පා සිටින සත්ත්ව සහ ශාක විශේෂ සංගණනයකට ලක් කර තර්ජනයේ ස්වභාවය මත ලැයිස්තු ගත කිරීමත්, එම සත්ත්ව හා ශාක විශේෂ කෙරෙහි වැඩි අවධානයක් යොමු කර අවශ්‍ය සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමත් සිදු කිරීම ආරම්භ කරන ලදී.

1960 සහ 1970 දශකවල ප්‍රධාන වශයෙන් ජීවී විශේෂයන් සහ ඔවුන්ගේ පැවැත්මට අවශ්‍ය වාසස්ථාන ආරක්ෂා කිරීම සඳහා අවධානය යොමු කර මිහිපිට ජීවත් වන සෑම ශාක හෝ සත්ත්ව විශේෂයක්ම වඳ වීමේ තර්ජනයට ලක් නොවන පරිදි ඔවුන්ගේ ආරක්ෂාව සහතික කරලීම සඳහා 1964 වර්ෂයේදී තර්ජනයට ලක් වූ ජීවී විශේෂවල රතු ලැයිස්තුව නිර්මාණය කරන ලදී. එතැන් සිට ජීවී විශේෂයන් මුහුණ පා ඇති අවදානම ඇගයීමට ලක් කර නිවැරදි උපමාන සහිත සකස් කරන දත්ත ප්‍රභවය ලෙස රතු දත්ත ලැයිස්තුව හඳුන්වා දිය හැක.

රතු දත්ත ලයිස්තුව පිළිබඳව බොහෝ දෙනෙකු අදහස් කරන්නේ මෙම ලයිස්තුවට ඇතුළත් වන්නේ දැනට ජීවයේ නොපවතින මීට පෙර වාසය කරන ලද ජීවීන්ගේ ලේඛණයක් ලෙසය. එසේත් නොමැති නම් දැනට ලෝකයෙන් වඳවී ගිය ජීවීන් පමණක් ඇතුළත් කරන ලේඛනයක් ලෙසය. නමුත් මෙම ලේඛණයට කිසියම් ජීවියකුගේ දත්ත ඇතුළත් කිරීමේදී එම ජීවී විශේෂයේ පැවැත්ම, ව්‍යාප්තිය, වඳ වීමේ තර්ජනයකට ලක්ව ඇත්නම් තර්ජනයේ ස්වභාවය, තර්ජනයට බලපා ඇති ආසන්නතම හේතු, යම් කිසි ජීවියෙක් මුළුමනින්ම මිහිපිටින් වඳ වී තිබේද සහ දැනට ජීවය පවතින සහ නොපවතින ජීවීන් පිළිබඳව තොරතුරු අධ්‍යයනයට ලක් කර සකස් කරන ලේඛණයක් ලෙස සරලව දැක්විය හැක.

එසේ නම් අප මතක තබා යුතු කාරණයක් වන්නේ රතු දත්ත ලයිස්තුව නිර්මාණය කිරීමේ අරමුණක් වන්නේ ගොලීය වශයෙන් වඳ වීමට ලක්ව ඇති ශාක හෝ සත්වයින්ගේ හුදු ලයිස්තුවක් පමණක් නොව අනාගතය දී එම ලැයිස්තුවට ඇතුළත් වීමට ඉඩ ඇති සත්ව හා ශාක හදුනා ගෙන අවශ්‍ය කරන සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පෙළඹවීම ලබා දෙන මෙවලමක් ලෙසය.

### රතු දත්ත ලැයිස්තුව කාණ්ඩ කිරීම

රතු දත්ත ලැයිස්තුව මූලික වශයෙන් කාණ්ඩ නවයකට බෙදා වෙන් කර ඇති අතර, ගෝලීය වශයෙන් ජීවී විශේෂ වඳ වීමේ අවදානම පදනම් කර ගෙන මෙම වර්ගීකරණය සිදු කර ඇත.

- නෂ්ට වූ / වඳවී ගිය ජීවී විශේෂ - Extinct (EX)
- ස්වභාවික පරිසරයෙන් වඳ වූ - Extinct in the Wild (EW)
- වඳවී යාමේ උග්‍ර තර්ජනයට ලක්වූ ජීවි විශේෂ - Critically Endangered (CR)
- වඳවී යාමේ අවධානමකට ලක්වී ඇති ජීවි විශේෂ - Endangered (EN)
- අනතුරකට ගොදුරු හැකි විශේෂ - Vulnerable (VU)
- තර්ජනයට ආසන්න ජීවි විශේෂ (නුදුරු අනාගතයේදී අනතුරක් ඇති විය හැකි) - Near Threatened (NT)
- අවම අවදානමක් ඇති ජීවි විශේෂ - Least Concern (LC)
- ප්‍රමාණවත් දත්ත නොමැති ජීවි විශේෂ (අවධානමකට ලක්ව ඇතිද නැද්ද යන්න තීරණය කිරීමට ලැබී ඇති දත්ත ප්‍රමාණවත් නොවන) - Data Deficient (DD)
- දැනට තක්සේරු නොකළ එනම් ඇගයීමට ලක්නොවූ විශේෂ (අගය තීරණය කර නොමැති විශේෂ) - Not Evaluated(NE)

වඳවී ගිය තර්ජනයට ලක්ව ඇති අඩු අවධානමක් ඇති




ස්වභාවික පරිසරයෙන් වඳ වී ගොස් ඇති තර්ජනයට ආසන්න

## නෂ්ට වූ/ වඳවී ගිය ජීවි විශේෂ (EX)

මෙම කාණ්ඩයට අයත් සියළුම ජීවීන් ස්වභාවික පරිසරයේ මෙන්ම සංරක්ෂණ තත්ත්වයන් යටතේ පවා නොමැති අතර, මෙම විශේෂවලට සමාන අළුත් පරපුරක් බිහි කිරීමට සමත් විශේෂයන් බිහි වී නොමැති සහ පෘථිවිය මත සිටින අවසාන ජීවියා පවා වඳවී ඇති ජීවි විශේෂයන් වේ. මේ යටතට ඩෝඩෝ පක්ෂියා (Raphus cucullatus), සහ පිරිමි සුදු රයිනෝ වැනි සත්ත්වයින් පෙන්වා දිය හැක. මෙම විශේෂ ජීවය තුළින් වඳ වී යාමට බල පෑ හේතු ලෙස පරිනාමය වීමේ ගැටළු හා ජානමය ගැටළු, වාස භූමි අහිමි වීම, විලොපිකයන්ට ගොදුරු වීම, යැපෙන්නන්ගේ වඳවී යාම, ආහාර හිඟ වීම, ස්ඵොටන අවදි පසු කිරීම, ස්වභාවික ආපදා හා ස්වභාවික මරණය වැනි හේතු පෙන්වා දිය හැක.



ඩෝඩෝ පක්ෂියා



සුදු රයිනෝ (පිරිමි)

## ස්වභාවික පරිසරයෙන් වඳ වූ (පරම්පරා ගත ගහනයෙන් තොර වූ) - (EW)

පෙර වාර්තා වූ පරම්පරා ගහනයන් සංසංදනය කරන විට උග්‍ර ලෙස පසුබෑමකට ලක්වී ඇති ජීවී විශේෂ වේ. නිජබිම් අහිමි වීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා ස්වභාවික පරිසරයෙන් වඳවී ගොස් ඇති නමුත්, සංරක්ෂණය කරන ලද තත්ත්ව යටතේ පමණක් (සත්වෝද්‍යාන/ උද්භිද උද්‍යාන හා සංරක්ෂණ මධ්‍යස්ථාන ආදිය) දැකිය හැකි මෙම ජීවී විශේෂ ඇතැම් විට එක් ජීවියකුට පමණක් සීමා විය හැකි වීම. උදා:- අල්ෆොන්සියා හෝර්ටෙනිසිස් Alphonsea hortenisis (Annonaceae) ශාකය පේරාදෙණිය උද්භිත උද්‍යානයෙ සංරක්ෂිත තත්වයේ වගා කර ඇත.

## දැඩි අවධානමට ලක්වූ ජීවී විශේෂ (CR)

වඳවීමේ දැඩි තර්ජනයට මුහුණ පා සිටින මෙම ජීවී විශේෂ නුදුරු අනාගතයේදී මිහිමතින් වඳවී යාමේ උග්‍ර අවධානමක් පවතින බැවින් මෙම කාණ්ඩය යටතට ගැනේ. කෘඩියා සෙලෙනිකා (Crudia Zeylanica), ස්ට්‍රෝබිලන්තස් ආනෝට්ටියානා (Strobilanthes arnottiana Acanthaceae) වැනි ශාක සහ විල් මුවා (Axis porcinus) බන්දුල පෙතියා (Bandula barb) උග්‍ර ලෙස අවධානමට ලක්වූ ජීවී විශේෂ ලෙස දැක්විය හැකිය.

මෙම ජීවී විශේෂවල **උග්‍ර වඳ වීද වී** යාමේ අවදානමට පත්වීමට හේතු ලෙස කුඩා ප්‍රදේශයක පමණක් දක්නට ලැබීම, චර්යා රටාවල පැහැදිලි වෙනසක් සහිත වීම, පරිනත ගහනයේ පැහැදිලි අවගමනයක් සහිත වීම, සැරිසරන ප්‍රදේශවල ළදරු ගහනයේ හා පරිනත ගහනයේ පැහැදිලි උච්ඡාවචනයක් සහිත වීම වැනි කරුණු පෙන්වා දිය හැක.


විල්මුවා


ස්ට්‍රෝබිලන්තස් ආනෝට්ටියානා


බුලත් හපයා (බන්දුල පෙතියා)

## වඳවී යාමේ අවධානමට ලක් වී ඇති ජීවී විශේෂ (EN)

මෙම ජීවී විශේෂ සඳහා ස්වභාවික පරිසරයේ වඳවී යාමට බලපාන හේතු සාධක බහුල නිසා ඉහළ අවධානමට ලක්විය හැකි විශේෂ මෙම කාණ්ඩයට ඇතුළත් වේ. ලංකා අරන්ගයා, කළු වදුරා, සහ ආසියානු අලියා (Elephas maximus), හදුන් දිවියා මෙම කාණ්ඩයට උදාහරණ ලෙස දැක්විය හැක.


කළු වදුරා


ආසියානු අලියා


හදුන් දිවියා

## අනතුරට ලක්විය හැකි ජීවී විශේෂ (VU)

දැඩි ලෙස වඳ වී යාමේ තර්ජනයට ලක් නොවුණද, ඔවුන්ගේ පැවැත්මට තර්ජනයක් වන සාධක අවම නොවුණ හොත් හෝ ඔවුන්ගේ බෝවීම වේගවත් නොවුන හොත් අනාගතයේ තර්ජනයට ලක්වීමේ හැකියාව ඉතාමත් ඉහළ අවදානමක් පවතින විශේෂ මෙම

කාණ්ඩයට අයත් වේ. වත රතු මල්කොහා (Phaenicophaeus pyrrhocephalus), ශ්‍රී ලංකා මයිලගොයා (Columba torringtoniae) හා ශ්‍රී ලංකා කැහිබෙල්ලා වැනි ජීවී විශේෂ මෙම කාණ්ඩය යටතේ දැක්විය හැක.



ශ්‍රී ලංකා කැහිබෙල්ලා

## තර්ජනයට ආසන්න ජීවී විශේෂ (NT)

CR, EN, VU, යන කාණ්ඩ වලට අයත් නොවන නමුත්, නුදුරු අනාගතයේ දී වඳවීමේ තර්ජනයට ලක්වීමේ හැකියාවක් සහිත, අවධානය යොමුකර සංරක්ෂණය කළ යුතු, සංරක්ෂණ පියවර නොගතහොත් තර්ජනයට ලක්විය හැකි ජීවී විශේෂ මෙයට අයත් වේ. උදා - ශ්‍රී ලංකා අළු ගිරවා, වල් බළලා, ඕලුමුවා



වල් බළලා

### අවම අවදානමක් ඇති ජීවි විශේෂ (LC)

මෙම කාණ්ඩයට අයත් වන්නේ ඉහත කාණ්ඩයන්ට අයත් නොවූ, අධ්‍යනයන් කර ඇති විශේෂ වේ. මෙම කාණ්ඩයට අයත් විශේෂවල බහුලතාවය නිසාම නුදුරු අනාගතයේ තර්ජයට ලක්වීමේ අවදානමක් නොමැති ජීවි විශේෂ මෙයට ඇතුළත්ව පවතී.  උදා රිලවා, තිත් මුවා, හිවලා



හිවලා

### ප්‍රමාණවත් දත්ත නොමැති/ දත්ත ඌනතා සහිත ජීවි විශේෂ (DD)

මෙම කාණ්ඩයට ප්‍රමාණවත් තොරතුරු නොමැති හා හඳුනාගැනීමේ ගැටළු ඇති, ව්‍යාප්තිය පිළිබඳව තොරතුරු නොමැතිවීම නිසා තවමත් අධ්‍යයනය කර නොමැති විශේෂ අයත් වේ

### දැනට තක්සේරු නොකළ, එනම් ඇගයීමට ලක් නොවූ විශේෂ (NE)

තවමත් මෙම විශේෂ පිළිබඳව අධ්‍යයනයන් කිසිවක් සිදු කර නොමැත. එමගින් මෙම ජීවි විශේෂ තර්ජනයට ලක්ව නැති බවක් අදහස් නොකෙරෙන අතර, හුදෙක් ඔවුන් යම් කාණ්ඩයක් යටතට දැමීමට අධ්‍යයනයක් සිදුකර නොමැති බව අදහස් වේ.

### රතු දත්ත ලැයිස්තුව හා ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ රතු දත්ත ලැයිස්තුවේ ආරම්භය එවක තර්ජනයට ලක්ව පැවැති ශාක හා  සත්ව විශේෂ ලයිස්තු ගතකිරීම උත්සාහයන් කිහිපයක් යටතේ සිදු විය. පළමුව 1987 වර්ෂයේදී ජාතික වශයෙන් තර්ජනයට ලක් වී ඇති ශාක පිළිබදව ප්‍රථම ලැයිස්තුවක් මහාචාර්ය බී අබේවික්‍රම මහතා විසින් සම්පාදනය කරන ලදි. පසුව 1989 වර්ෂයේදී මහාචාර්ය අබේවික්‍රම මහතා විසින්  සකස් කරන ලද මෙම ලයිස්තුවට ජාතික වශයෙන් වඳ වීමේ තර්ජනයට ලක්ව ඇති සත්ව විශේෂ පිළිබදව දත්තද එකතු කර  නැවත ප්‍රතිනිර්මාණය කරන ලදුව පසු කාලීනව දත්තද උපයෝගී කර ගෙන 1993 වර්ෂයේදී ශාක හා සත්වයින් පිළිබදව

යාවත්කාලීන කරන ලද දත්ත ලැයිස්තුවක් විජේසිංහ සහ වෙනත් අය එක්ව සකස් කර ඇත. මෙම දත්ත ලැයිස්තුව සකස් කිරීමේදී විද්‍යාත්මක නිර්ණායක මත පදනම් නොවී ඇගයීම් සිදුකිරීම වැනි අඩුපාඩු කම් හේතුවෙන් 90 දශකයෙ අග භාගය වන විට ජාතික වශයෙන් වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති ජීවී විශේෂ පිළිබදව ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ (IUCN) විසින් හදුන්වා දුන් ජාත්‍යන්තර නිර්ණායකයන් අනුව පිළිගත් විද්‍යාත්මක එකමුතුවකගේ තාක්ෂණික දායකත්වත්වය ඇතිව ජාතික වශයෙන් වැදගත් නිර්ණායක මාලාවක් සකස් කර 1999 වසරේදී ශාක හා සත්ත්ව විශේෂ ඇතුළත් කර රතු දත්ත ලැයිස්තුවක් නිර්මාණය කරන ලදී. කෙසේ වෙතත් රතු දත්ත ලැයිස්තුව සකස් කිරීමේ වගකීම පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය සතු වන අතර එය අවුරුදු 5 කට වතාවක් යාවත්කාලීන වියයුතුව තිබුණද නැවතත් රතු දත්ත ලැයිස්තුව යාවත්කාලීන වූයේ 2007 වසරේදීය. මේ සඳහා පරිසර අමාත්‍යාංශය හා IUCN ආයතනයේ මෙරට ශාඛාව සමඟ එකතුව මෙම ලැයිස්තුව නිර්මාණය විය. 2012 වසරේ රතු දත්ත ලැයිස්තුව නිර්මාණය වුයේ පරිසර අමාත්‍යාංශයේ අනුග්‍රය හා සම්බන්ධීකරණයෙනි.

2020 ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා පිළිබද සංරක්ෂණ තත්වය විදහා දැක්වෙන ජාතික රතු දත්ත ලැයිස්තුව ජාතික උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ ජාතික ශාකගාරයේ (National Herbarium) තාක්ෂණික දායකත්වයෙන් හා පරිසර අමාත්‍යංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය එක්ව යාවත්කාලීන කරන ලදී. සත්ව විශේෂ පිළිබද රතු දත්ත ලැයිස්තුව මේ වනවිටත් යාවත්කාලීන කරමින් පවතී.













## ජාතික රතු දත්ත ලැයිස්තුවට අතුළත් ජීවී විශේෂ

මත්ස්‍යයින් උරගයන් ක්ෂීරපායින් පක්ෂීන් සමනල්ලුන්, බත්කූරන්, කූහුඹුවන්, මීමැස්සන්, මකුළුවන්, මිරිදිය කකුළුවන්, හා ගොඩබිම වෙසෙන බෙල්ලන් හා වෘක්ෂලතා ලෙස දක්වා ඇත.

## 2012 ජාතික රතු දත්ත ලයිස්තුවට ඇතුළත් ජීවී විශේෂ හා ආවේණික විශේෂ

| ජීවී වර්ගය | විශේෂ ගණන | ආවේණික විශේෂ |
|---|---|---|
| සපුෂ්පක ශාක | 3154 | 894 |
| විවෘත බීජ ශාක | 2 | 0 |
| පර්ණාංග ශාක | 336 | 49 |
| මකුළුවන් | 501 | 256 |
| හැකරැල්ලන් | 19 | |
| මුහුදු බෙල්ලන් | 742 | |
| මිරිදිය කකුළුවන් | 51 | 50 |
| බත් කූරන් | 118 | 47 |
| කුහුඹුවන් | 194 | 33 |
| මීමැස්සන් | 130 | |
| සමනළයින් | 245 | 26 |
| තණකොළ පෙත්තන් | 257 | |
| කුරුමිනියන් | 103 | 21 |
| ගොළුබෙල්ලන් | 253 | 205 |
| මිරිදිය මත්ස්‍යයින් | 91 | 50 |
| උභයජීවීන් | 111 | 95 |
| උරගයින් | 211 | 124 |
| පක්ෂීන් | 240 | 27 +6 |
| ක්ෂීරපායින් | 125 | 21 |

ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය ව්‍යාප්තිය ස්වාභාවික සහ මිනිසා විසින් ඉදිකරන ලද පරිසර පද්ධති වලින් සමන්විත විවිධ මිරිදිය වාසස්ථාන ජාලයකින් සමන්විතව ඇත. මුළු දිවයින පුරා ව්‍යාප්තව පවතින ගංගා ද්‍රෝණි 103 ක එකතුවක් සහිතව ඇළ දොළ, වැව්, ගංවතුර තැනිතලා, තටාක, විල්ලු සහ කුඹුරු වැනි මිරිදිය වාසස්ථානවලින් මිරිදිය මත්ස්‍යයින් ඇතුළු ජලජ සත්ත්ව විශේෂයන්ද ඇතුළත් වේ. ශ්‍රී ලංකාව තුළ මිරිදිය මත්ස්‍ය විශේෂ ඒක දේශීය, දේශීය හා හඳුන්වා දුන් විශේෂ ලෙස කොටස් තුනකට බෙදා වෙන්කර හැකි අතර මිරිදිය මත්ස්‍යයින්ගෙන් වැඩි ප්‍රමාණයක් වාර්තා වන්නේ නිරිතදිග කලාපය, මහවැලි කලාපය හා වියළි කලාපය ආශ්‍රිතව වේ. එයින් විශේෂ 37 ක් නිරිතදිග කලාපයෙන් හමුවන අතර, තර්ජනයට ලක්ව ඇති හා ආවේණික විශේෂ විශේෂ 6 ක් හමු වන්නේ මහවැලි කලාප ආශ්‍රිතවය. වියළි කලාපයෙන්ද තර්ජනයට ලක්ව ඇති විශේෂ 6 ක් හමුවන අතර මැදි කලාපයෙන් වාර්තා වන්නේ අඩු විශේෂ සංඛ්‍යාවකි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍යයින්ට පවතින තර්ජිත තත්වය ඇගයීමට ලක්කර නිකුත් කරන ලද 2020 ජාතික රතු දත්ත ලේඛණයට අනුව, ශ්‍රී ලංකාවෙන් වාර්තා වෙන මිරිදිය මත්ස්‍ය විශේෂ ගණන 97ක් වන අතර ඉන් විශේෂ 61ක් ආවේණික වේ. සමස්ත මත්ස්‍ය විශේෂයන්ගෙන් 51 ක් තර්ජනයට ලක්ව පවතී.

වාර්තා වු මත්ස්‍ය විශේෂ 97 සඳහා පවතින තර්ජනයේ ස්වභාවය අනුව රතු දත්ත ලේඛනයේ දක්වා ඇති ඛාණ්ඩ කිහිපය පහත පරිදි වේ.

- දැඩි ලෙස වඳ වී යාමේ තර්ජනයට ලක් වූ විශේෂ (Critically Endangered) - 12

  උදා - නතාලි සාලයා, ගල් පන්ඩුරුවා, බන්දුල පෙතියා, රක්වාන දන්ඩියා, අශෝක පෙතියා, තිඹිරි පෙතියා, මාටින්ස්ගේ වැලිගොව්වා, බටකොළ තෙළියා, රක්වාන අහිරාව, නාකියා දෙනිය අහිරාව, දුඹුරු පොත්තණ්ඩ, අග්‍රා සාලයා
- වඳ වී යාමේ තර්ජනයට ලක් වූ විශේෂ (Endangered) - 29
- වඳ වී යාමේ අනතුරට ලක් වී ඇති විශේෂ (Vulnerable) - 10
- තර්ජනයට ආසන්න විශේෂ (Near Threatened) - 10
- අඩු අවදානමක් ඇති ජීවි විශේෂ (Least Concern) - 29
- ප්‍රමාණවත් දත්ත නොමැති ජීවි විශේෂ (Data Deficient) - 07

මෙරටට ආවේණික මත්ස්‍ය විශේෂ 61 සඳහා පවතින අවධානම හමුවේ පහත පරිදි වර්ග කර ඇත.

- දැඩි ලෙස වඳ වී යාමේ තර්ජනයට (CR) - 12
- වඳවීයාමේ තර්ජනයට (EN) - 24
- වඳවීයාමේ අනතුරකට ලක්වූ (VU) - 9
- තර්ජනයට ආසන්න (TN) - 5
- ප්‍රමාණවත් දත්ත නොමැති (DD) - 2
- අඩු අවදානමක් ඇති (LC) - 9

ආවේණික විශේෂයන්ට අමතරව දේශීය විශේෂ 36 ක් පහත පරිදි තක්සේරු කර ඇත.

- දැඩි තර්ජනයට ලක්ව ඇති 06 යි.
- තර්ජනයට ආසන්න 05 යි.
- ප්‍රමාණවත් දත්ත නොමැති 05 යි.
- අඩු අවධානයක් ඇති 20 යි.

ඉහත මත්ස්‍යයින් අතර උග්‍ර වඳ වීමේ තර්ජනයට ලක්ව සිටින බන්දුල පෙතියා දක්නට ලැබෙන්නේ ලෝකයේ එකම ස්ථානය වන කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලපිටමඩ, මිනීමරුකොලනිය නම් ස්ථානයෙනි. එම ප්‍රදේශයෙන් ගලා යන දොළ පහර දෙකක ඉතා සීමිත ප්‍රදේශයක පමණක් එම මත්ස්‍යයා ද දක්නට ලැබේ.



මල් පුළුට්ටා

තවද දැඩි ලෙස තර්ජනයට ලක් වූ විශේෂයක් වන මල් පුළුට්ටා දක්නට ලැබෙන්නේ ස්ථාන දහයකට අඩු සංඛ්‍යාවකිනි. ඒ අනුව ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විශේෂයට ඇති ප්‍රධාන තර්ජනය ලෙස වාසස්ථාන අහිමි වීම, වාසස්ථාන ඛණ්ඩනය, වාසස්ථාන වෙනස්වීම, ස්වභාවික පරිසරයෙන් ඉවත් කිරීම, ජලමාර්ග දූෂණය, ආක්‍රමණශීලී ජීවී විශේෂ හා දේශගුණික විපර්යාස වැනි හේතු මේ මත්ස්‍යයින් වඳවීමට බලපාන ප්‍රධාන සාධක වශයෙන් හඳුනාගෙන තිබේ.

## ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විශේෂයන්ගේ ගෝලීය තර්ජන තත්ත්වය

මෙතෙක් ගෝලීය රතු දත්ත ලැයිස්තුවේ ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය මත්ස්‍ය විශේෂ 18ක් ලෙස ඇතුළත් කර තිබූ අතර, 2019 දෙසැම්බර් මැද භාගය වන විට ආවේණික මිරිදිය මත්ස්‍ය විශේෂ 59 ක් ලෙස යාවත්කාලීන කර ඇත. කෙසේ වෙතත් වලංගුභාවය තහවුරු කර නොවීම හේතුවෙන් සිස්ටෝමස් රිච්මන්ඩි (Systmus Richmandi) සහ චන්න අරා (Channa ara) මත්ස්‍ය විශේෂ ගෝලීය තක්සේරුව අදාළ කර ගෙන නොමැති අතර බන්දුල පෙතියා (Pehia bandula) හා තම්බලයා (Labeo lankae) ගෝලීය රතු දත්ත ලැයිස්තුවට ඇතුළත් කර ඇත්තේ දැඩි ලෙස වඳවීමේ තර්ජනයට ලක්වී ඇති ජීවී විශේෂ යටතේය.

2009 අංක 22 දරණ සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත මඟින් නීතියෙන් ආරක්ෂා කර ඇති මිරිදිය මත්ස්‍ය විශේෂ සංඛ්‍යාව 17 කි. ඉන් කිහිපයක් පහත පරිදි වේ.



ශ්‍රී ලංකාවේ 2020 ජාතික රතු දත්ත ලයිස්තුවේ එළි දක්වන ලද වෘක්ෂලතාවලට අදාළ වාර්තාවට අනුව ශාක විශේෂ ඇතුළත් කිරීමේදී ඇල්ගී, දිලීර, ලයිකන, තලසා ශාක, මීවන ශාක හා බීජ ශාක (විවෘත බීජ ශාක හා ආවෘත බීජ ශාක) ලෙස ලයිස්තුගත කර ඇත. එහිදී 2012 ජාතික රතු දත්ත ලැයිස්තුව ඇතුළත් වූ සපුෂ්පක ශාක (ආවෘත බීජ ශාක), විවෘත බීජ ශාක හා මීවන ශාක විශේෂයන්ට අමතරව ඇල්ගී, දිලීර, ලයිකන, තලසා ශාක වැනි ගවේශණයට ලක් නොවූ විශේෂ මෙවර රතු දත්ත ලැයිස්තුවට අළුතින් එකතු කර විෂය තව දුරටත් පුළුල් කර ඇති බව පෙන්වා දිය හැක. මෙම ශාක විශේෂ අතරින් මීවන (පර්ණාංග) ශාක කුළ 31 ට අදාල විශේෂ 350 ක් ඇගැයීමට ලක්කර ඇති අතර එයින් මීවන ශාක විශේෂ 42 ක් මෙරටට ආවේණික ඒවා වේ. මීවන විශේෂ 207 ක් තර්ජනයට ලක්ව ඇති අතර, ආවේණීන විශේෂ 42න් විශේෂ 28 ක් තර්ජනයට ලක්ව ඇත. තවත් විශේෂ 25ක් මෙම සියවසේ ඇගයීමට ලක් නොවී ඇති බවත් ඒවා වඳ වී ගොස් ඇති බවට විශ්වාස කරන Critically Endangered (Possibly Extinct) අතර ඉන් විශේෂ 4 ක් ආවේණික විශේෂ වේ.


මීවන (පර්ණාංග)


තලස ශාක


ලයිකන


දිලීර

2012 ජාතික රතු දත්ත ලැයිස්තුවට අනුව සපුෂ්පක ශාක විශේෂ 3154 හඳුන්වා දී තිබු අතර ඉන් විශේෂ 131 ක් මුල් අවස්ථාවේදී විදේශීයව හඳුන්වා දුන් විශේෂ ලෙස හඳුනා ගෙන පසුකාලීනව සැබෑ දේශීය ව්‍යාප්තියක් සහිතව ස්වාභාවිකරණයට ලක් වූ විශේෂ ලෙස හඳුනාගැනීමත් හා වෙනත් වැරදි ලෙස හඳුනා ගැනීම් වැනි කරුණු මත මෙවර ලැයිස්තුව සැකසීමේදී ඉවත් කර ඇති අතර නව විශේෂ 64 ක් අළුතින් හඳුන්වා දී ඇත.

ඒ අනුව 2020 වෘක්ෂලතාවලට අදාල රතු දත්ත ලැයිස්තුව සැකසීමේදී සපුෂ්ප ශාකවලට ඇති තර්ජිත ස්වභාවය අනුව රතු දත්ත ලැයිස්තුවට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. එහිදී කුළ 186 කට අයත් සපුෂ්පක ශාක විශේෂ 3,087 ක් ඇගැයීමට ලක් කර ඇති අතර එයින් විශේෂ 863 ක් ආවේණික ශාක වේ. ඇගයීමට ලක් කළ සපුෂ්පක ශාක විශේෂ 3087න් 1496 ක් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ඒවා ලෙස ලැයිස්තු ගත කර ඇත. මෙම අගය රටේ සමස්ථ සපුෂ්ප ශාක වලින් 48.4% කි. ආවේණික විශේෂ 863 න් විශේෂ 625 තර්ජනයට ලක්ව ඇති අතර, මෙම අගය අවේණික විශේෂවලින් 72% කි. මෙරට සමස්ත සපුෂ්ක ශාක විශේෂ 3087න් විශේෂ 1403 ක් එනම් 45%කට ආසන්න ප්‍රමාණයක් ශාක කුළ 10 ක් පුරා පැතිරී පවතින බව විශේෂයෙන් පෙන්වා දිය හැකි අතර, ශාකවලට පවතින තර්ජනයේ ස්වභාව අනුව ශාක කුළ 186 න් කුල 64 ක සමස්ත සපුෂ්පක ශාක ගහනයෙන් 50% පමණ තර්ජනයට ලක්ව අති අතර ශාක කුළ 25 ක සියළු විශේෂ තර්ජනයට ලක්ව ඇති බවද හඳුනාගෙන ඇත. ඉහත තර්ජනයට ලක් වූ ශාක විශේෂයන්හි භූ ගෝලීය පැතිරීම අනුව මහනුවර, රත්නපුර, නුවරඑළිය, බදුල්ල, මාතලේ, ගාල්ල සහ කළුතර වැනි තෙත් කලාපීය දිස්ත්‍රික්ක වල වැඩිම තර්ජනයට ලක් වූ විශේෂ සංඛ්‍යාවක් සිටින බව දක්වා ඇත.

2012 ජාතික රතු දත්ත ලැයිස්තුවට අනුව මෙරටින් වඳ වී ගිය ලෙස ලැයිස්තු ගත කර තිබූ ශාඛ වර්ග 05 න් තුනක් වන රිනෝරියා බෙංගාලන්සි (Rinorea bengalensis), රිනෝරියා ඩෙකොරා (Rinorea decora) සහ කෘඩියා සෙලනිකා (Crudia zeylanica) යන ශාක නවතම සමීක්ෂණවලට අනුව තව දුරටත් සංරක්ෂිත වී පවතින බව තහවුරු කර තිබෙන අතර ශාක විශේෂ දෙකක් තවදුරටත් වඳ වී ගිය ශාක ලෙස ඇතුළත් කර ඇත. මෙම ශාක අතරින් පසුගිය කාලයේ මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී මහත් ආන්දෝලනයට තුඩු දුන් කෘඩියා සෙයිලනිකා ශාකය ඇතුළුව මෙම ශාක වර්ග තුන මෙරටින් වඳ වී ගිය ශාක නොවන අතර වදවී යාමේ දැඩි තර්ජනයට (Critically Endangered) ලක්ව ඇති ශාක බවට ඇතුළත් කර ඇති අතර මෙම කාණ්ඩය යටතේ ඇතුළත් විශේෂ සංඛ්‍යාව 295 ක් ලෙස යාවත්කාලීන වී තිබෙනවා.



කෘඩියා සෙලනිකා (Crudia zeylanica)



රිනෝරියා බෙංගාලන්සි (Rinorea bengalensis)



රිනෝරියා ඩෙකොරා (Rinorea decora)

නවතම සමීක්ෂණවලට අනුව කෘඩියා සෙලනිකා ශාකය ගම්පහ දිස්ත්‍රික්කයෙන්ද රිනෝරියා බෙංගලන්සි ශාකය රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්කයෙන්ද රිනෝරියා ඩෙකොරා ශාකය මහනුවර දිස්ත්‍රික්කයෙන්ද වාර්තා වී තිබේ.

තව දුරටත් මෙරටින් වඳ වී ගිය ශාක ලෙස ජාතික ශාකාගාරයේ වියළි නිදර්ශක ලෙස තැම්පත් කර ඇති නේලු විශේෂයේ ශාකයක් වන ස්ට්‍රෝබිලන්තස් කෘඩාටා (ඇකන්තසී) Strobilanthes Caudata (Acanthaceae) හා සූරිය කාන්ත කුලයේ ශාකයක් වන බ්ලූමියා අඟුස්ටිෆෝලියා (ඇස්ටරේසී) Blumea angustifolia (Asteraceae) යන විශේෂ ඇතුළත් කර ඇත. මෙවර රතු දත්ත ලැයිස්තුවෙන්, වඳ වී ඇතැයි විශ්වාස කරන ශාක විශේෂ කාණ්ඩය යටතේ Critically Endangered (Possibly Extinct) විශේෂ 128 ක් ඇතුළත් කර ඇති අතර ඉන් විශේෂ 54 ක් ආවේණික විශේෂ වේ. මේවා දැනට දැකගත නොහැකි බැවින් වඳ වී ගොස් ඇතැයි විශ්වාසය පළ කරති.

2012 රතු දත්ත ලැයිස්තුවට අනුව ස්වාභාවික පරිසර තත්වය යටතේ වඳ වී ගියත් (EW) පේරාදෙණිය ජාතික උද්භිත උද්‍යානයේ සංරක්ෂිත තත්වයේ පමණක් පවතින ශාකයක් ලෙස නම් කර තිබූ පිනි බෙරලිය (Shorea ovalifolia ෂෝරියා ඕවාලිෆෝලියා) ශාකය පසුකාලීනව ස්වභාවික පරිසරයෙන් වාර්තා වූ බැවින් 2020 ලැයිස්තුවෙන් එම ශාකය දැඩි ලෙස වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති (CR) ශාකයක් ලෙස ඇතුළත් කර ඇත.

තවත් ශාක විශේෂ දෙකක් ස්වාභාවික පරිසරයෙන් වද වී ගොස් ඇතත් පේරාදෙණිය ජාතික උද්භිත උද්‍යානයේ සංරක්ෂිත තත්වයේ පවතින Alphonsea hortenisis (Annonaceae) සහ ජම්බු කුලයේ ශාකයක් වන Eugenia xathocarpa (myrtaceae) යන ශාක විශේෂ ඇතුළත් කර ඇත. ඒ අනුව ස්වභාවික පරිසරයෙන් යම් විශේෂයක් වඳ වී ගියත් පරිභාහිර සංරක්ෂණ ක්‍රියා මාර්ගයක් ලෙස ශාක විතැන් සංරක්ෂණයේ සුවිශේෂී කාර්යභාරයක් ජාතික උද්භිද උද්‍යානය මගින් ඉටුකරන බවයි.

ශ්‍රී ලංකාවේ විවෘත බීජ ශාක විශේෂ දෙකක් පමණක් දැකගත හැකි වන අතර ඒවා මඩු (සයිකස් නතෝර්ස්ට්) සහ මහ මඩු (සයිකාස් සෙයිලනිකා) ලෙස හැඳින්වේ. මඩු ශාක විශේෂය වඳවීයාමේ අනතුරකට ලක්විය හැකි (VU) ශාකයක් ලෙසත්, මහ මඩු ශාක විශේෂය දැඩි ලෙස වඳ වී යාමේ තර්ජනයට (CR) ලක්ව ඇති ශාකයක් ලෙස නම්කර ඇති අතර, ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ වැඩි පැතිරීමක් සහිත මහා මඩු ශාකය සුනාමි ව්‍යවසනයෙන් විශාල හානියක් සිදු වී ඇති බව වාර්තා වේ.



මඩු ශාකය



මහ මඩු ශාකය

## ජාතික රතු දත්ත ලැයිස්තුවක් සකස් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ

01. රටක පරිසරය සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීමේදී තොරතුරු ලබා ගැනීමට හැකි වීම.

02. රටක සංවර්ධන ක්‍රියාදාමයේදී ස්වභාදහම සංරක්ෂණය සඳහා අවශ්‍ය තීරණ ගැනීමට උපකාරී වීම.

03. අධ්‍යාපන හා දැනුම ලබාදීම ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කළ හැකි වීම.

04. විද්‍යාත්මක පදනමකින් පර්යේෂණ පැවැත්වීමට අවශ්‍ය පසුබිම සැකසීම.

05. සංරක්ෂණ ක්‍රියාදාමයේදී සාධාරණ ලෙස සම්පත් බෙදා හැරීමට උපකාරී වීම.

06. මානව සෞඛ්‍ය සහ ජීවනෝපායන් සඳහා දායක වීම.

යම් රටකට රතු දත්ත ලැයිස්තුවක් එම රටේ ජෛව විවිධත්වය තිරසාරව භාවිතා කොට ආරක්ෂා කිරීම සඳහාත්, මුළු මහත් ලෝකයේම අවධානය යොමු කර ගැනීමට සමත් වූ අගනා කාර්යයභාරයක් ඉටු කරන කදිම මෙවලමකි. තවද මෙමඟින් පෙන්වා දෙන පරිදි තර්ජනයට ලක්ව ඇති ජීවී විශේෂ පිළිබඳව අවධානය යොමු කරමින් තර්ජනයට ලක්ව ඇති ශාක හා සත්ව විශේෂ එම තර්ජනයන්ගෙන් මුදවා අවශ්‍ය සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය හා අනෙකුත් පාර්ශවයන්ගේ උනන්දුව හා දායකත්වය ලබාගැනීමට මග පාදයි. එබැවින් මානව ක්‍රියාකාරකම් සහ පාරිසරික තත්වයන් යටතේ සිදුවන ව්‍යවසනකාරී අවස්ථා හේතුවෙන් වඳ වී යාමේ තර්ජනයට මුහුණ පාන ශාක සහ සත්වයින්ගේ අනාගතය සුරක්ෂිතතාව තීරණය කරන රතු දත්ත ලේඛණය පිළිබඳ අවබෝධයෙන් සිටීම මානව වර්ගයාට සුභදායී වනු ඇත.

## මූලාශ්‍ර


1. 2020 වෘක්ෂලතා පිලිබඳව ප්‍රකාශයට පත් කරන ලද රතු දත්ත ලැයිස්තුව.

2. 2020 මිරිදිය මත්ස්‍යයන් පිලිබඳව ප්‍රකාශයට පත් කරන ලද රතු දත්ත ලැයිස්තුව

3. 2020 වෘක්ෂලතා පිලිබඳව ප්‍රකාශයට පත් කරන ලද රතු දත්ත ලැයිස්තුව එළි දැක්වීමේ අවස්ථාවේ ආචාර්ය සිරිල් විජේසුන්දර මහතා ඉදිරිපත් කරන ලද දේශණය

4. 2012 ජාතික රතු දත්ත ලැයිස්තුව

5. අන්තර් ජාලය